# පසන් පොසොන්



ගගන ගැබෙන් පුරහඳ පා යාවී
මිස්සක පව්වම ඉන් බබ ළාවී
ඒ සුබ දිනයට සිත දිව යාවී
මිහිඳු සමිඳු ගැන සිහියට ඒවී

තිස්ස නිරිඳු දඩ කෙළියට ආවා
මුව පොව්වෙකු පසුපස එළ වූවා
මිස්සක පව්වේ අසළට ආවා
සුබ නැකතක් ඒමොහොතේ ලැබුවා

රජුගේ නමින්ම අමතනු කවු රුද
සිතමින් පව්වට තමනෙත් හෙලූ සඳ
පිරිවර සමගින් සිටිනා මන නඳ
අනුබුදු හිමියන් දුටුවා පුර රද

ලක්දිව දම්දිව කරනට සිතුවා
ඔබ වෙත සම්බුදු කරුණා පිදුවා
හිමි මුවගින් අම දම්රස ගැලුවා
පොසොන් සඳත් ඒ අමදම් ඇසුවා

♦ ඩබ්. එම්. මධුෂිකා කල්පනී
ජනාධිපති විද්‍යාලය
මිනුවන්ගොඩ Sri Lanka


## පොසොන් උදාවයි ! මිහින්තලාවයි !

විනෝදයට දඩ කෙළියේ
යෙදී සිටිය තිස්ස නිරිඳු
රන් මුව පොව්වෙකු දැකලා
ලුහුබැඳ යන්නට සිතුවා
රන් මුව පොව්වා පසුපස
තිස්ස නිරිඳු දුව යන විට

තිස්ස ඔහොම නවතින්නැයි
සුමිහිරි වදනක් ඇසුණා
නමින් මාව ඇමතිය හැකි
ජගතා කවුරුන්ද කියා
තිස්ස නිරිඳු කළබලයෙන්
එහෙ මෙහෙ වටපිට බැලුවා
මිහින්තලා ගල මුදුනේ
රන් පැහැයෙන් බැබළි බැබළි
සිටින මිහිඳු හිමි දැකලා
නිරිඳුගෙ කෝපය නිවුණා

සම්මා සම්බුදු හිමිගේ
දහම් පණිවුඩය අරගෙන
අනුබුදු හිමි වැඩියේ ඒ
පොසොන් පෝය දා

♦ කේ. අචිරා
සෙව්වන්දි සෝමරත්න
ශ්‍රී සුදර්ශන දහම් පාසැල
නිල්පනාගොඩ මිනුවන්ගොඩ
Sri Lanka




## Children's Corner

### The Origin of the Alphabet ? අකුරුවල උපත

Writing is much older than we think. Ancient people drew pictures to stand for the sounds which they used in speaking one to another. Men of the Stone Age scratched writing on bones of the animals they had eaten and on the walls of their caves. The Egyptians wrote first on stone and then on papyrus made of reeds that grew on the banks of the Nile. The Assyrians scratched their cuneiform (wedge-shaped) writing on clay tablets and cylinders. Gradually animal skins, wax tablets, wood, bark and finally the paper were used. The Latin word 'paper' comes from the word 'papyrus'.

ලිවීම අප සිතනවාට වඩා පැරණිය. ආදීහු එකිනෙකාට කතාකරන වචනවල ශබ්ද හැඳින්වීමට විවිධ චිත්‍ර ඇන්දාහ. ගල් යුගයේ මිනිස්සු සංඥා රූප මගින් සතුන්ගේ ඇටකටුවල හා ගුහා බිත්තිවල අදහස් ලිවූහ. මිසර වාසීන්ගේ පළමු ලියවිලි කෙටුවේ ගල්වලය. පසුව නයිල් නදිය ඉවුරේ වැවෙන වියලි පැපිරස් කොළ වල ලියූහ. ඇසිරියානුවෝ උල් හැඩයේ අකුරු මැටි ලැලි හා මැටි බඳුන්වල සටහන් කළෝය. ක්‍රමයෙන් ලිවීමට සතුන්ගේ සම්, ඉටි පුවරු, ලෑලි ගස්වල පොතු ආදියද, අවසානයේ කඩදාසියද ගැනිණ. කඩදාසි හඳුන්වන **පේපර්** යන ලතින් වචනය ඇති වුනේ නයිල් නදිය අසබඩ වැවුණු ගස වූ **පැපිරස්** යන වචනයෙනි.

♦ *Auntie Ramani ( රමණී නැන්දා)*


ලංකා බැංකුව
BANK OF CEYLON
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

## ලන්ඩන් ශාඛාව

**ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරීමේ මහඟු අවස්ථාවක් !**

* ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.


* ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. පවුම් වලින්ම පොළිය ලබාගැනීම.
2. ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරීමේ හැකියාව.
3. NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ HSBC, NATWEST, BARCLAYS බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*

HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624
NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732
BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859

**No 1, Devonshire Square, London EC2M 4WD**
Phone : 020 7377 1888 Fax: 020 7377 5430
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit



# ඇසේ මතුවන කඳුළු බිඳුගෙන ඔබේ සිරිපා දොවන්නම්......

You can spend hours in-front of this statue. It's difficult to imagine the skill of the artist, converting a giant rock into a magnificent artwork,1000 years ago. There was no room for error. You can really feel your insignificance in front of the statue. I saw these foreigners crying, some hugging the statue. Perhaps they belong to a strange religion or they may even be Buddhists. There were around fifteen of them gazing at the statue. I thought of asking what was that crying all about, but changed my mind. They were all in some form of meditative state, I understood.

මෙම බුද්ධ ප්‍රතිමාව අබියස, ඒ දෙස බලාගෙන පැය ගණනක් රැඳී සිටිය හැකිය. වසර 1000 කට පෙර යෝධ ගල් පර්වතයක් අතිශය චිත්තාකර්ෂණීය මෙවන් කලා නිර්මාණයක් බවට හැරවූ මේ මහා කලාකරුවාගේ නිර්මාණාත්මක කුසලතාව කොතෙක්දැයි මැනගැන්ම අසීරුය. මෙම නිර්මාණයෙහි කිසිදු වරදක් වැරදුණු තැනක් නැත. මේ දැවැන්ත ප්‍රතිමාව අබියස දී ඔබ නොවැදගත් පුද්ගලයෙකු බවට පත්වේ. බොහෝ විදේශිකයින් ඇතැම්විට ප්‍රතිමාවේ දෙපතුල් බදා හඬනවා මම අනන්තවත් දුටුවෙමි. ඒ අය බොදුනුවන් වෙන්නට හෝ නොවෙන්නට පුළුවන. පහළොස් දෙනෙක් පමණ ප්‍රතිමාව දෙස බලාගෙන සිටියහ. අඬන්නේ ඇයි දැයි ඔවුන්ගෙන් අසන්නට මට සිතුණි. එහෙත් ඒ අදහස මම වෙනස් කර ගත්තෙමි. ඔවුන් කිසියම් භාවනාවක යෙදී සිටිනා බවක් මට අවබෝධවිය.

*හෙළ කලාශිල්ප ආශ්වයයී ලොවට විදහාපාන අවුකන බුද්ධප්‍රතිමා වහන්සේ*

ඇසේ මතුවන කඳුළු බිඳුගෙන
ඔබේ සිරිපා දොවන්නම් ......
හදේ මැළැවෙන කැලෑ මල්ගෙන
ඔබේ සිරි පා පුදන්නම්

කෙලෙස් මළ පිරි නුවර අත හැර
බවුන් වඩනට වනේ වැඩි ඔබ
සොයා ආවෙමි පොලෝ තලයේ
අනේ පිහිටක් නොමැති වූ විට

ඉහළ නිල්වන් අහස විනිවිද
නැගෙන ඔබගේ යෝධ බුදු බඳ
මගේ නෙත සිත මෝහනය කර
මගේ කුදු බව පසක් කර ඇත

බුද්ධ භක්තිය, බුද්ධාලම්බන ප්‍රීතිය සිත පුරා දනවන, එසේම ඇසෙන සෑම වචනයකම සිත පහන් කරවන ගතියක් කා වැදුණු ඉතා උසස් ගීතයක් වශයෙන් විශාරද අමරදේවයන් ගයන, මහගම සේකර කිවිවරයාණන් රචනා කළ ඇසේ මතුවන කඳුළු බිඳු නම් මෙම ගීතය අගය කරන්නෙමි. අවුකන බුදු පිළිම වහන්සේ යම් සේ ලාංකික ජනතාවගේ සිත්තුළ ඉමහත් ගෞරව සම්ප්‍රයුක්ත හැඟීමක් ඇතිකර ඇද්ද, ඒ හා සමානව භක්තියක් මේ ගීතය ශ්‍රවනය කරන්නාගේ සිතට ද කාවද්දයි. සමාධියට ළංකරවයි.

ප්‍රතිමා වහන්සේ දකින්නට අවුකන වනයට යායුතු වෙයි. එය සැබැවින්ම ජීවමාන බුදුන් වහන්සේ සොයාගෙන ගියා හා සමානය. නගරයේ දුක්ඛදායක කටුක ජීවිතයෙන් මිදී කෙළෙසුන් නසන්නට උන්වහන්සේ වසර දෙදහස් ගණනකට පෙර වනාන්තර ගතවීය. ඒ පුවත සැබවක් කරමින් ප්‍රතිමා වහන්සේ ගස් කොලන් වලින් ආවරණය වූ තැනකය වැඩ සිටින්නේ. වෙනත් පූජනීය ස්ථාන යක නොදැනෙන ආකර්ෂණීය ගතියක් අවුකන ඇත්තේ ඒ නිසාය.

මේ ගීතයේ එන වචන වලින් මතුකරන අර්ථය සැබෑ ජීවිතයට වඩාත් සමීපයයි කිවයුතුය. ඒ සමීප බව අන්කිසිවක් නොව අනූපමේය භක්තියමය. හදවත මලක්සේ ගෙන බුදුන්වහන්සේ පුදනවා යන අදහසත්, ඇසේ මතුවන කඳුලින් උන්වහන්සේගේ සිරිපා දෝවනය කරනවා යන්නත් මෙයට පෙර කිසිදු ගීතයකින් ඇසූ බවක් මට මතක නැත.


සංසාරයේ සරන අතර දෛනික දුක්ඛ දෝමනස්සයන්ගෙන් පීඩිතව, සරණක් නොමැතිව, හිස හැරුණු අත යන ජනයාට කිසියම් පිළිසරණක් සඳහා ඒ උත්තුංග ප්‍රතිමා වහන්සේ වැඩ හිඳිනවා යන හැඟීම අවුකන බුදුන්වහන්සේ දුටු මුල් දවසේම මට ද ඇතිවිය. එසේම අප කොතරම් කුඩා සුළු පුද්ගලයින් නොවේ දැයි දැනෙන්නේ ඒ යෝධ ප්‍රතිමා වහන්සේ ඉදිරියට ගිය විටය.

සිංහල කලා නිර්මාණයන් කොතරම් සූක්ෂම ලෙස සිතා අතීත කලාකරුවා තැනුවේද යන්න විශ්මය දනවන අතර ඔවුන් ගැනද අපට අප්‍රමාණ ආදරයක් භක්තියක් නිතැතින්ම ඇතිවෙයි.

***කාව්‍ය සංකල්පනාව - මහගම සේකර***
***ගායනය - විශාරද අමරදේව***



**සේකර**



**අමරදේව**

♦ **සමන්ත ද මෙල්**
Sri Lanka